www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

1. පහත දක්වෙන නිර්වචනය ආශ්‍රයෙන් (i) (ii) හා (iii) කොටස්වලට පිළිතුරු සපයන්න.
"ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන, මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, වෙළඳාම හා අනුබද්ධිත සියලු සේවා, ව්‍යාපාර ලෙස අර්ථ දක්විය හැකි ය."

(i) අයෝජකයින්ට ලාභ උපයා දීමට අමතර ව ව්‍යාපාරවලින් වෙනත් ඇල්මැති පාර්ශ්වවලට ලැබෙන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉහත නිර්වචනයේ අඩංගු පහත දක්වෙන සංකල්ප පැහැදිලි කරන්න.
(අ) අවශ්‍යතා හා වුවමනා
(ආ) භාණ්ඩ හා සේවා (ලකුණු 04)

(iii) (අ) 'වෙළඳාම' අර්ථ දක්වන්න.
(ආ) අනුබද්ධිත සේවා නම් කරන්න.
(ඉ) ප්‍රාථමික නිෂ්පාදනය හා ද්විතීයික නිෂ්පාදනය සසඳන්න.
(ඊ) බෙදාහැරීමේ නියුක්ත අතරමැදියන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 04)

(iv) (අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර බලවේග නම් කරන්න.
(ආ) එම බලවේගවලින් ඕනෑම **දෙකක්** තෝරාගෙන, ඒවා ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) පහත සඳහන් ව්‍යාපාර ආචාරධර්ම සංකල්ප පැහැදිලි කරන්න.
(අ) සත්‍ය දැ සන්නිවේදනය කිරීම
(ආ) අන් අයට හානි නොකිරීම (ලකුණු 04)
(මුළු ලකුණු 20)

2. (i) (අ) රජයක ආර්ථික අරමුණු **හතරක්** නම් කරන්න.
(ආ) එම අරමුණු ඉටු කර ගැනීමට ව්‍යාපාරවලට දායක විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) (අ) රජයට ආදායම් ලැබෙන ප්‍රධාන මාර්ග ලෙස සෘජු හා වක්‍ර බදු දක්විය හැකි ය. සෘජු බදු හා වක්‍ර බදු නිදසුන් සහිත ව වෙන වෙන ම පැහැදිලි කරන්න.
(ආ) 'GMP සහතිකකරණය' හඳුන්වන්න.
(ඉ) දේශීය වශයෙන් නිපදවනු ලබන යම් යම් ආහාර නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා SLS ප්‍රමිතිය අනිවාර්ය වේ. එවැනි ආහාර නිෂ්පාදිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) අමල්, බිමල් හා වමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යති. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔවුන් අතර මතභේදයක් පැන නැඟී ඇත.
1. ලාභ බෙදාගැනීමේ අනුපාතය
2. යෙදූ ප්‍රාග්ධනයට පොළී ලබා ගැනීම
3. සක්‍රීය හවුල්කරුවන් වන බිමල්ට හා වමල්ට වැටුප් ලබා ගැනීම
4. අමල් සපයා ඇති ණය මුදලට පොළී ලබා ගැනීමට ඉල්ලුම් කිරීම

හවුල්කරුවන් අතර පවතින ගිවිසුමේ මේ කරුණු සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නො වේ. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව මෙම අවස්ථාවේ හවුල්කරුවන් කටයුතු කළ යුතු ආකාරය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) 2007 අංක 07 දරන සමාගම් පනත අනුව සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍රය සමඟ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) (අ) වරලත් ව්‍යාපාරයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(ආ) වරලත් ව්‍යාපාර සංවිධාන ක්‍රමය මඟින් වරලත් හිමියාට සහ වරලත් ලාභියාට ලැබෙන ප්‍රතිලාභ **තුන** බැගින් වෙන වෙන ම සඳහන් කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 20)

[දෙවෙනි පිටුව බලන්න.

Alevel ඇප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

3. (i) (අ) ව්‍යවසායකයා, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර පවත්නා සම්බන්ධතාව කුමක්ද'යි පැහැදිලි කරන්න.
(ආ) ව්‍යවසායකයින් බිහි වීමට පසුබිම් වන සාධක **හතරක්** පැහැදිලි කරන්න (ලකුණු 04)

(ii) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා 2012 රාජ්‍ය අයවැය ලේඛනය මගින් යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 04)

(iii) (අ) පොදු පිළිගැනීම හොඳ මුදලක ගුණාංගයකි. ගනුදෙනුවේ දී පොදු පිළිගැනීමක් ඇති වීමට නම් මුදල් තවත් ගුණාංග කිහිපයකින් යුක්ත විය යුතු ය. එවැනි ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
(ආ) පහත දක්වෙන මුදල් වර්ග පැහැදිලි කරන්න.
1. ණය මුදල්
2. ව්‍යවහාර මුදල් (නියෝග මුදල්) (ලකුණු 04)

(iv) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ නියමුවා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු නම් කර එම අරමුණු සාක්ෂාත් කර ගන්නේ කෙසේද'යි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) වර්තමානයේ බොහොමයක් බැංකු සේවා විද්‍යුත් ආකාරයෙන් සිදු වේ. විද්‍යුත් බැංකුකරණය යටතේ සිදුවන සේවාවන් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

4. (i) (අ) රක්ෂණයෙන්
1. පුද්ගලයාට හා පවුලටත්
2. ව්‍යාපාරවලටත්
ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.
(ආ) රක්ෂණය හා සම්බන්ධ පහත සඳහන් පද පැහැදිලි කරන්න.
1. අවදානම හා උපද්‍රවය (Risk and Cause)
2. අලාභ හා හානි (Loss and Damage) (ලකුණු 04)

(ii) මෑත කාලයේ ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහන පද්ධතියේ කැපී පෙනෙන සංවර්ධනයක් ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහන් කළ හැකි ය. මෙවැනි අධිවේගී මාර්ග ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව වැඩි වීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) සන්නිවේදන ක්‍රියාවලියේ අන්තර්ගත ප්‍රතිචාරය සහ ප්‍රතිපෝෂණය වෙන් වෙන් ව හඳුන්වන්න. (ලකුණු 04)

(iv) සිල්ලර වෙළඳමේ නව ප්‍රවනතාවකි 'සුපිරි වෙළඳසැල්'. මෙම සුපිරි වෙළඳසැල් පාරිභෝගිකයින් අතර ජනප්‍රිය වීමට බලපා ඇති හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(v) (අ) තොග වෙළඳම අර්ථ දක්වන්න.
(ආ) තොග වෙළෙඳුන් වර්ග **දෙකක්** නම් කරන්න.
(ඉ) තොග වෙළෙන්දගෙන් ඉටු වන කාර්ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

II කොටස

5. (i) සංවිධානයක අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම පිණිස කළමනාකරණ ක්‍රියාවලිය උපකාර වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) මෙහෙයවීම යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
(ආ) හොඳ නායකයකු තුළ තිබිය යුතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
(ඉ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය හඳුන්වන්න. (ලකුණු 04)

(iii) (අ) බලතල පැවරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ කවරේ ද?
(ආ) සමහර විට සැලසුම් අසාර්ථක වේ. එසේ සැලසුම් අසාර්ථක වීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) (අ) මෙහෙයුම් කළමනාකරණයට අදළ පරිවර්තන ක්‍රියාවලියේ ස්වභාවය පෙන්නුම් කරන්න.
(ආ) තොග පාලනය කිරීමේ ක්‍රමයක් ලෙස JIT ක්‍රමය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) කොන්ත්‍රාත්කරුවකුට ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ලැබී ඇත. මෙම ඉදිකිරීම සඳහා වඩාත් ම යෝග්‍ය පිරියත සැලැස්ම නම් කරන්න. ඔබ නම් කළ පිරියත සැලැස්මේ ස්වභාවය ද පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

[තුන්වෙනි පිටුව බලන්න.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

6. (i) (අ) නිෂ්පාදිතයක ගුණත්වය යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද'යි පැහැදිලි කරන්න.
(ආ) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.
1. සමස්ත ගුණත්ව කළමනාකරණය (TQM)
2. ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) (ලකුණු 04)

(ii) පහත දක්වෙන අලෙවිකරණ හර සංකල්ප පැහැදිලි කරන්න.
1. වටිනාකම හා තෘප්තිය
2. හුවමාරුව හා ගනුදෙනු ලකුණු 04)

(iii) වර්තමානයේ අලෙවිකරුවෝ ගනුදෙනුකරුවන්ට වැඩි වටිනාකමක් ලබාදීම සඳහා සිය නිෂ්පාදිත විවිධ මට්ටම් යටතේ වෙළඳපොළට ඉදිරිපත් කරති. නිෂ්පාදිතයක් ඉදිරිපත් කෙරෙන විවිධ මට්ටම් අනුපිළිවෙළින් නම් කර, ඒවා වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ඇති මහීපාල මහතා ගොයම් මැඩීම සඳහා නව යන්ත්‍රයක් නිර්මාණය කර ඇත. මෙම යන්ත්‍රයේ කාර්යක්ෂමතාව පිළිබඳ ව අදළ කෘෂිකර්ම පර්යේෂණ ආයතනවල සහතිකකරණය ද ලැබී තිබේ. මෙම යන්ත්‍රය නිපදවා වෙළඳපොළට ඉදිරිපත් කිරීමට ඔහු සූදනමින් සිටී. මෙම යන්ත්‍රය වෙළඳපොළට හඳුන්වාදීමට සුදුසු ප්‍රවර්ධන උපකරණයක් ගැන ඔහු සලකා බලමින් සිටී.
ව්‍යාපාර අධ්‍යයනය හැදෑරූ ශිෂ්‍යයකු හැටියට මහීපාල මහතාගේ ගොයම් මැඩීමේ යන්ත්‍රය වෙළඳපොළට හඳුන්වාදීමට වඩාත් යෝග්‍ය ප්‍රවර්ධන උපකරණය නිර්දේශ කරන්න. ඔබ එම ප්‍රවර්ධන උපකරණය නිර්දේශ කිරීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) (අ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය යනු කුමක් ද?
(ආ) ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති වීමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල කවරේ ද?
(ඉ) ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති අවස්ථාවක එය වැඩි කර ගැනීම සඳහා ගත හැකි කෙටිකාලීන පියවර කවරේ ද? (ලකුණු 04)
(මුළු ලකුණු 20)

7. (i) සීමාසහිත දර්ශන සමාගමේ ශේෂ පත්‍රයෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දක්වේ.
- සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 10
- 10% වරණීය කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 8
- 12% ණයකර රුපියල් මිලියන 7

වසර කිහිපයක සිට මෙම සමාගමේ ලාභදායකත්වය ද පහළ මට්ටමක පවතී.
දර්ශන සමාගමට රුපියල් මිලියන 2 ක අතිරේක අරමුදලක් ලබා ගැනීමට අවශ්‍ය වී ඇත.
මෙම අතිරේක අරමුදල් ලබා ගැනීමට වඩා යෝග්‍ය මූල්‍ය මාර්ගය සාමාන්‍ය කොටස් ද? වරණීය කොටස් ද? ණයකර ද? ඔබගේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) සීමාසහිත පොදු සමාගමකට කොළඹ කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තුගත විය හැකි ක්‍රම දෙකක් පහත දක්වේ.
1. මූලික නිකුතුව තුළින් (Offer for subscription)
2. විකුණුම් අර්පණයක් මගින් (Offer for sale)
මෙම ක්‍රම **දෙක** වෙන වෙන ම පැහැදිලි කරන්න.

(ආ) කොටස් වෙළඳපොළේ හුවමාරු වන සාමාන්‍ය කොටස්වල ආයෝජනය තුළින් ආයෝජකයකුට අත්වන ප්‍රතිලාභ **ගතරක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) පහත දක්වෙන්නේ පාසල් විවාද කණ්ඩායමට ලැබුණු මාතෘකාවකි.
"සංවිධානයකට වඩා වැදගත් වන්නේ මානව සම්පත ද? නොඑසේ නම් සෙසු සම්පත් ද?"
ඔබ නියෝජනය කරන්නේ **මානව සම්පත වඩා වැදගත් ය** යන පාර්ශ්වය නම් එම අදහස සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) (අ) රැකියා විස්තරයකින් ප්‍රකාශ කෙරෙන්නේ කුමක් ද?
(ආ) රැකියා පිරිවිතරයකින් ප්‍රකාශ කෙරෙන්නේ කුමක් ද?
(ඉ) අනුස්ථාපනයෙන් කුමන ප්‍රතිලාභ අපේක්ෂා කෙරේ ද?
(ඊ) වැඩ වර්ජනවලට පිවිසෙන්නේ නැතිව සේවකයින්ට ගත හැකි වෙනත් වෘත්තිය ක්‍රියාමාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(v) (අ) කාර්යඵල ඇගයීම යනු කුමක්ද'යි හඳුන්වා, එමගින් ආයතනයක් අපේක්ෂා කරන අරමුණු කවරේද'යි පැහැදිලි කරන්න.
(ආ) පහත සඳහන් දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.
1. සාමූහික කේවල් කිරීම
2. පසුබිම පරීක්ෂණ (ලකුණු 04)
(මුළු ලකුණු 20)

[හතරවෙනි පිටුව බලන්න.

Alevel ලැප් උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

8. (i) පහත දැක්වෙන තොරතුරු පද්ධති හඳුන්වා ව්‍යාපාර ආයතනයක් තුළ ඒවා පරිශීලනය කරන පුද්ගලයන් නම් කරන්න.
   1. ගනුදෙනු සැකසුම් පද්ධති (TPS)
   2. විධායක උපකාරක පද්ධති (ESS) (ලකුණු 04)

   (ii) නූතන තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ව්‍යාපාර ආයතනයකට ලැබිය හැකි ප්‍රතිලාභ පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (iii) පහත සඳහන් දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   1. ලෝක ව්‍යාප්ත වෙබ් (www)
   2. බාහිර ජාලය (Extranet) (ලකුණු 04)

   (iv) දුරීමට සිදුවන පිරිවැය හා කාලය ගැන සලකා සමහර ව්‍යාපාරිකයෝ ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට මැළිකමක් දක්වති. ව්‍යාපාර සැලසුම් ගැන අධ්‍යයනය කර ඇති ඔබ මෙවැනි ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර සැලැස්මක ඇති වැදගත්කම අවබෝධ කර දෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (v) (අ) සාමාන්‍යයෙන් ව්‍යාපාරයක වර්ෂයක් අවසානයේ සකස් කෙරෙන මූල්‍ය ප්‍රකාශ සහ ව්‍යාපාර සැලැස්මක ඇතුළත් කෙරෙන මූල්‍ය ප්‍රකාශ අතර කවර වෙනසක් ඔබ දකින්නේ ද?

   (ආ) ව්‍යාපාරිකයකුට ලිඛිත ව්‍යාපාර සැලැස්මකින් ලැබිය හැකි ප්‍රයෝජන බොහෝ ය. එවැනි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.